# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2209/43 - 2021 ජනවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2021.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 05/2021 දරන සුරාබදු නිවේදනය

සංශෝධනය කරන ලද පරිදි (52 වන අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 4 සහ 12 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම විසින් මෙම නිවේදනය මගින්, මෙම නිවේදනය ප්‍රකාශයට පත් කරන දින සිට බලපැවැත්වෙන පරිදි -

(1) එසේ ප්‍රකාශ කරන දින සහ ඊට පසු, සිල්ලරට විකුණනු ලබන සීමාව, මුළු දිවයිනටම බලපැවැත්වෙන පරිදි සහ සාමාන්‍ය මිළදී ගැනීම්වලට අදළව, රා ප්‍රමාණය ලීටර් තුනක් (03) විය යුතුය ;

(2) ප්‍රකාශිත ආඥාපනතේ 13 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව, ප්‍රකාශ කරන දිනය සහ ඊට පසුව ලීටර තුනට (03) වැඩි රා ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම, මුළු දිවයිනටම සාමාන්‍යයෙන් නියම කරන පරිදි, නොකළ යුතුය ; සහ

(3) 1985 අගෝස්තු 14 වැනි දින පළ කරනු ලැබූ අංක 745 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

01- 556


1A - PG 5264 — 600 (2021/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*